

# ශ්‍රීලාල් සෙනෙවිරත්නගේ "දෝෂාභියෝගය" එළිදැක්වුණ දා




ලාංකේය පාඨක සමාජයට නව ප්‍රකාශන අත්දැකීමක් එක්කරමින් ''සන්නස ප්‍රකාශන'' සිය ප්‍රථම ග්‍රන්ථය එළිදැක්වීම ඉකුත් මාර්තු මස 18 වන දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී උත්සවාකාරයෙන් සිදුකරන ලදි. දෝෂාභියෝගයක් මගින් අගවිනිසුරු ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක ධුරයෙන් නෙරපා හැරීමේ ක්‍රියාවලිය අළලා මාධ්‍යවේදී ශ්‍රීලාල් සෙනෙවිරත්න සංස්කරණය කළ ''දෝෂාභියෝගය'' පොත එදින සන්නස මංගල ප්‍රකාශනය ලෙසින් එළිදැක්විණ. පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති එම අවස්ථාවට එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් තිස්ස අත්තනායක, පාර්ලිමේන්තු මන්ත්‍රී, ජනාධිපති නීතිඥ විජේදාස රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති නීතිඥ උපුල් ජයසූරිය, ඇතුළු දේශපාලකයන්, වෘත්තීයවේදීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීහු සහභාගිවූහ.

**එහිදී ආරාධිත දේශකයන් සභාව අමතා අදහස් දැක්වූයේ මෙසේය.**

## සාධාරණ සමාජයක් සදහා වන ජනතා ව්‍යාපාරයේ කැදවුම්කරු **පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි**

අපේ රටේ සිරිතක් තියනවා මොනතරම් බරපතල සිදු වීමක් වුවත් ජනතාවට මොහොතකින් අමතක වෙනවා. නැවතත් වෙනත් ප්‍රශ්නයක් එනවා. පසුගිය කාලයේ සුදු කැස්බෑවෙක් ආවා. සුදු කැස්බෑව ආවම ඔක්කොම අමතකයි. ඊළඟට ආවා වල්ලපට්ට. වල්ල පට්ටෙ ආවම ඒක අමතකයි. දැන් ඇවිල්ලා ඉන්නවා කිඹුල් හූනෙක්. ඒක තමයි දැන් රටේ තියන ප්‍රධාන ප්‍රශ්නය වෙලා තියෙන්නේ. කටුනායක කම්කරු ඝාතන, රතුපස්වල පාසල් සිසු ඝාතන සියල්ල, යට ගිහිල්ල කබරහූනා මතුවෙනවා. වල්ලපට්ටෙ මතුවෙනවා. ඒ වගේම මේ රටේ අගවිනිසුරුවරිය ධුරයෙන් ඉවත් කරන්න ගෙනාපු දෝෂාභියෝගයත් අමතක වෙලා.



ඒත් මේ දෝෂාභියෝගය එහෙම වළලා දැමිය යුතු එකක් නොවෙයි. ඒ සිද්ධවෙච්ච අසාධාරනය අයුක්තිය ශිරාණි බණ්ඩාරනායක මැතිණියට නෙවෙයි මේ රටේ යුක්තියටල මේ රටේ නීතියට වෙච්ච බරපතල අසාදාරණයක්. ''විනයෝ නාම ශාසනස්ස ආයෝ'' කියා බුදුහාමුදුරුවෝ දේශනා කළා. මගේ ශාසනය තියෙන්නේ විනය තියනකම් විතරයි. විනයක් නැති ශාසනයක් පවතින්නේ නෑ. විනයක් නැති රටක් පවතින්නෙත් නෑ. අග්‍ර විනිශ්චයකාර ධුරය වැනි උසස් තනතුරකින් ඉවත් කිරීමකදී ගෞරවාන්විත ශීලාචාර ක්‍රමවේදයක් අනුගමනය කරන්න ඕනේ. ඒ පිළිබඳ තීන්දු ගැනීම සුදුසුකම් සහිත ස්වාධීන විනිශ්චය මණ්ඩලයකට බාර දිය යුතුයි. එහෙම දෙයක් අපේ සිදුවුණේ නෑ. අගවිණිසුරුවරියට විරුද්ධව පාර්ලිමේන්තුව නඩු දාලා, නඩුව ඔවුන්ම අහල තීන්දුවත් ඔවුන්ම දෙනවා. නඩු දාලා, එතුමියට උත්තර බදින්න දුන්නේ පැය දහයක කාලයක්. ඒ විතරක් නෙවෙයි එතුමියට කථා කළ ආකාරය හැසිරිච්ච ආකාරය එතුමියට හූ කිව්වා. මේක නොසළකා හරින එක බරපතල කාරණයක් නොතකා හැරීමක්. මේ මරා දැම්මෙ වෙන දෙයක් නොවෙයි රටේ නීතියයි. මෙය අමතක කරල අපි කොහොමද සාධාරණය සොයා යන්නේ. දැන් අපිට නීතියක් නෑ. අපිට ආරක්ෂාවක් නෑ. අපි කොහාටද යන්නේ සාදාරණය සොයාගෙන.



කතුවරයා 'දෝෂාභියෝගය' පොතේ මුල් පිටපත පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන් වෙත පිළිගන්වමින්

## නීතිඥ සංගම් එකමුතුවේ කැඳවුම්කරු **ජ්‍යෙෂ්ඨ නීතිඥ ජේ සී වැලිඅමුණ මහතා**



අධිකරණ පද්ධතිය දිහා බලද්දි විනිශ්වයකාවරයෙකු පත් කළ සම්ප්‍රදායක් තිබුනා. අද බොහොමයක් විනිශ්වයකාරවරු ඉන්නෙ නීතිපති දෙපාර්තමේන්තුවෙන් පැමිණි අයයි. විනිශ්වයකරුවෙකු පත්කරද්දි අප්‍රකාශිත මූලික පදනමක් තිබිය යුතුයි. ඉහළ අධිකරණයේ විනිශ්වයකාරවරයෙකු පත්වන්නේ කුමන පදනමකින්ද යන්න අද අපි කවුරුත් දන්නෙ නෑ. නමුත් ඉහල අධිකරණයේ විනිශ්වයකාරවරයෙකු ඉවත් කරන්න පුථවන් දෝෂාභියෝගයක් ගෙනල්ලා. එය සම්මත කරල ජනාධිපතිවරයා අත්සන් කළ පසුව ශිරාණි බණ්ඩාරනායක මහත්මියට ගෙන එන ලද දෝෂාභියෝගය අවස්ථාවේ අපි දුටුවා ලංකාවේ අපරාධකරුවෙකුටවත් තිබෙන පහසුකම් ඇයට ලැබුනේ නෑ. මුළු ක්‍රියාපටිපාටියම නිතිවිරෝධියි. ශ්ෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය තීන්දු දෙකක් දීල තිබුනා. ඒවා පසෙකලා ක්‍රියා කළා. දෙසැම්බර් 10 මෙම දෝෂාභියෝගයට විරෝධය පා අධිකරණ සංකීර්ණයේ සිට පාර්ලිමේන්තුවට පා ගමනක් යන්න සැළසුම් කර තිබුනා. එවිට හමුදාව පොලිසිය පැත්තකට වී බලා සිටිද්දි පාතාල හමුදාවක් කඩු පොලු රැගෙන අධිකරණ භූමිය වට කළා.



කර්තෘ ශ්‍රීලාල් සෙනෙවිරත්න පොල්තෙල් පහන දල්වමින්

නීතියට පිටින් ගිහින් නඩු තීන්දු ඉවත දීලා දෝෂාභියෝගය ගෙනවිත් අගවිණිසුරුවරිය ඉවත් කළා. දේශපාලකයො කියන්න උත්සාහ කරනවා නීතියේ අධිපත්‍යයට වඩා පාර්ලිමේන්තුව උත්තරීතරයි කියලා. ඒ අය උත්සාහ කරනවා ගස් වැවෙන්නෙ මල් පිපෙන්නේ වැස්ස වහින්නේ ඉර හඳ පායන්නේ දේශපාලකයන් නිසයි කියලා ජනතාවට ඒ බව පෙන්නන්න. අපට සිදුවෙනවා මේ පුහු මතය වෙනස් කරලා ජනතාව උත්තරීතරයි කියලා යහපාලනය ඉදිරියට ගෙන ඒමට.



පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ විජේදාස රාජපක්ෂ මහතා සභාව අමතමින්

**"දෝෂාභියෝගය" සන්නස මීඩියා ප්‍රකාශනයකි**


රූපවාහිනී මුතුහර

දෙවන ජාත්‍යන්තර ළමා සමාජය

අංක2514 මුතුහර මෙල්බර්න් ළමා සමාජය

ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති මුතුහර හා එක්ව - මෙල්බර්න් නුවර සිටින පුංචි ඔබගේ දස්කම් විස්කම් ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ රටටම පෙන්වන්න - මුතුහර හා එක්වන්න.

හැකියාවන් වැඩිදියුණු කරගනිමින් - යහගුණ සමඟ මානව පෞර්ශය තම ජීවිතයට එකතු කර ගන්න - එක්වන්න දුවේ පුතේ රූපවාහිනී මුතුහර 2514 මෙල්බර්න් ළමා සමාජය සමඟ...

ලේකම් සුභාෂි ඒදිරිවීර සභාපති අනුග කල්දේරා

ඔබත් අප හා එක්වන්න කැමතිනම් අමතන්න,

අනුශාසක-සංවිධායක වත්සලා ඉෂ්ටවීර

රූපවාහිනී මුතුහර අංක2514

දු.කෘ 0409568547

ඊ-මෙල්: muthuharamelbourne@hotmail.com


එජාප ප්‍රධාන ලේකම් තිස්ස අත්තනායක මහතා දොෂාභියෝගය කියවමින්

